සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/06/EP/01/චක්‍රලේඛ - 2026
ඔබේ අංකය / உமது இல / Your No: ..............................................
දිනය / திகதி / Date: 2026.02.03

**සමෘද්ධි චක්‍රලේඛ අංක - 2026/02 ට පළමු එකතුව.**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම දිස්ත්‍රික් විෂයභාර නිලධාරීන්,
සියළුම සමෘද්ධි මූලස්ථාන ,බැංකු සමිති, ව්‍යාපෘති කළමනාකරුවන්,

**සමෘද්ධි අලෙවි සංවර්ධන වැඩසටහන - 2026.**

අස්වැසුමලාභී පවුල්වල තරුණ තරුණියන්ගේ හඳුනාගත් කුසලතාවයන් මත ඔවුන් වෘත්තීය පුහුණු අවස්ථා සඳහා යොමුකර වෘත්තීය නිපුණතාවයක් ලබාදී සුදුසු රැකියා සඳහා යොමුකිරීම අරමුණු කොටගත් වෘත්තීය පුහුණු වැඩසටහන හා බැඳේ.

02. 2026/01/09 දිනැති සමෘද්ධි චක්‍රලේඛ 2026/02 ට අනුව අස්වැසුමලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා පුහුණුලාභීන් තෝරාගැනීම පහසුකර ගැනීමට සුභසාධක ප්‍රතිලාභී මණ්ඩලයේ (WELFARE BENEFITS BOARD) වෙබ් අඩවියෙන් බාගත කරගන්නා ලද වයස අවුරුදු 16-45 අතර අස්වැසුම ප්‍රතිලාභී පවුල්වල තරුණ තරුණියන් දිස්ත්‍රික් මට්ටමින් විසිරී ඇති ආකාරය මේ සමඟ ඔබ වෙත එවමි. (ඇමුණුම - 01)

03. 2026 වසරේ අස්වැසුමලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රතිපාදන වෙන්කර ඇත්තේ සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ(WBB) ඉහත දත්ත පාදක කරගෙනය.ඒ අනුව එනම් වයස අවු 16 -45 අතර මුළු තරුණ ජනගහනයෙන් 01% ක් ඉලක්ක කරගෙන 2026 වසරේ අස්වැසුමලාභී පවුල් වල තරුණ තරුණියන් 20,000 ක් රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා යොමුකිරීම 2026 වසරේ අපේක්ෂිත ඉලක්කය වේ. මෙහි පළමු අදියර සඳහා මේ වනවිට 60% ක ප්‍රතිපාදන දිස්ත්‍රික්ක වෙත නිදහස් කර ඇත. (ඇමුණුම - 02) .

04. සමෘද්ධි චක්‍රලේඛ අංක 2026/02 හි අංක 02 II ඡේදය යටතේ අස්වැසුම ප්‍රතිලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු වැඩසටහන යටතේ පාඨමාලා ගාස්තු ගෙවීම පහත සඳහන් පරිදි දක්වා ඇත. “ එක් පුහුණුලාභියෙක් වෙනුවෙන් වැය කල හැකි උපරිම පාඨමාලා ගාස්තුව රු.50,000.00කට සීමාවන අතර ඊට වැඩි පාඨමාලා ගාස්තු රු.100,000 ක උපරිමයකට යටත්ව,දිස්ත්‍රික් ලේකම් /දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියෙන් ලබාදිය හැකිය” යන්න “ **වෘත්තීය පුහුණු**

පාඨමාලා සඳහා ප්‍රතිපාදන ලබාදීමේදී රු.**50,000.00** දක්වා ප්‍රතිපාදන ප්‍රදේශීය ලේකම්ගේ අනුමැතියෙන් ලබාදිය හැකි අතර රු.**50,000.00** ට වඩා වැඩි පාඨමාලා සඳහා රු.**50,000.00** මුදලට අමතරව රු.**50,000.00** ට වඩා වැඩිවන මුදලින්

**80% ක් පමණක් ලබාදිය හැකි වේ. නමුත් එම උපරිම සීමාව රුපියල් ලක්ෂයක මුදලට යටත්විය යුතුය.**එම අමතර පාඨමාලා ගාස්තුව දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ අනුමැතියෙන් ලබාදිය හැකිය" ලෙස සංශෝධනය විය යුතු බව කාරුණිකව දන්වමි.

I. 2025 අලෙවි සංවර්ධන වැඩසටහන යටතේ වෘත්තීය පුහුණුව සඳහා ශිෂ්‍යත්ව මුදල් ලබාගැනීමට නොහැකි වූ එහෙත් ඔවුන් විසින් පාඨමාලාව සඳහා යම් වාරිකයක් ගෙවා පුහුණුව ආරම්භ කල අස්වැසුම ප්‍රතිලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා මෙම වසරේ දී පාඨමාලාව අවසන් කිරීමේ පදනම මත 2026 වසරේ ප්‍රතිපාදන මගින් 2026/02 චක්‍රලේඛ කොන්දේසිවලට යටත්ව මුදල් ගෙවිය හැකිය.

II. එමෙන්ම 2025 වසරේ අවසානයේ ප්‍රතිපාදන සීමාසහිත වීම මත පාඨමාලා ගාස්තුවලින් කොටසක් පමණක් ගෙවූ පුහුණුලාභීන්ගේ ඉතිරි පාඨමාලා ගාස්තු 2026/02 වසරේ චක්‍රලේඛ කොන්දේසිවලට යටත්ව ගෙවීම් සිදුකල හැකිය.

III. රැකියා ඉලක්ක කරගත් කිසියම් වෘත්තීය පුහුණු පාඨමාලාවක 2025 වර්ෂයේදී එක් අදියරක් පමණක් අවසන් කර ඇති පුහුණුලාභීන් සඳහා එම පාඨමාලාවේ ii අදියර හැදෑරීම අත්‍යවශ්‍යම වනවිටදී පමණක් 2026 ප්‍රතිපාදන වලින් ගෙවීම් කල හැක.(එක් ලියාපදිංචි ගාස්තුවක් පමණක් ගෙවීමේ පදනම මත).

IV. 2026/02 චක්‍රලේඛයේ 1 A හා ඇමුණුම 03 යොදා ගත යුතු බවට සඳහන් වුවද අත්‍යවශ්‍යම අවස්ථාවකදී ප්‍රාදේශීය මට්ටමින් එහි යම් සංශෝධනයන් සිදුකල යුතු නම් දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ අධීක්ෂණයට යටත්ව සංශෝධනය කිරීමට දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත බලය පවරමි.

V. 2026/02 අංක 02 (ii) හි පුහුණුලාභීන් තෝරාගැනීමේ වයස් සීමාවන් 2026/3 චක්‍රලේඛය සඳහාද වලංගු කර ගත යුතුය.

VI. **2026/03 චක්‍රලේඛයේ පුහුණු පාඨමාලාවන්** සඳහා ගෙවීම් කිරීමේදි ගෙවීම් සීමාවන් ඉහත 4 ඡේදයේ දක්වා ඇති සීමාවන්ට යටත්ව ප්‍රධාන කාර්යාලය මගින් අනුමැතිය ලබා දීමට කටයුතු කරනු ලබන බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

සි.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

01. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් - කා.දැ.ගැ.පි.
02. ලේකම්,ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
03.සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කා.දැ.ගැ.පි.
04. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
05. ප්‍රධාන මූල්‍ය නිලධාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.හා අ.ක.ස.
06. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.හා අ.ක.ස.
07. ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගේ හා නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්වරුන් - -කා.දැ.ගැ.පි.
08. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
09. සියළුම සමෘද්ධි ප්‍රජා මූල බැංකු කළමනාකරුවන්, - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
10.සියළුම සංවර්ධන නිලධාරින්, - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
11.සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරින්. - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.